# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1821/37 - 2013 අගෝස්තු මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2013.08.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ, 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති, මහින්ද රාජපක්ෂ වන මම, එවක නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශ මත, මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම් කොටස "දියවර පියස" පරිසර අධ්‍යයන කේන්ද්‍රය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා වහා අවශ්‍ය වී ඇති බවට 2008.05.21 දින අංක 1550/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මෙයින් අවලංගු කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 ජූලි මස 25 වැනි දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බණ්ඩාරගම ප්‍රාදේශීය සභා සීමාවේ, අංක 694 බී දිගන්තුඩුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පමුණුගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ලයනල් චන්ද්‍රරත්න මහතා විසින් මැන පිළියෙල කරන ලද අංක 424 හා 2007.05.26 දින දරන සැලැස්මේ දැක්වෙන 'දෙල්ගහගොඩැල්ල සහ ඉඳිගහදෙනිය' නැමති ප්‍රමාණයෙන් හෙක්. 4.5401ක් (අක්. 11, රූඩ් 0, පර්. 35) විශාල වූ කැබලි අංක 1 වශයෙන් දක්වා ඇති ඉඩම් කොටස.

ඉහත කැබලි අංක 1 දරන ඉඩම් කොටසට මායිම් :-

*කැබලි අංක 1 - ප්‍රමාණය හෙක්ටයාර් 4.5401 (අක්. 11, රූඩ් 0, පර්. 35)*

| | | |
|---|---|---|
| *උතුරට* | : | පොතුකොළවලදෙනිය, ඊ. නෝනහාමි, දොන් ලෝවිස් සහ තවත් අය හිමිකම් කියන ඉඩම ; |
| *නැගෙනහිරට* | : | පී. ඇලියස් පෙරේරා හිමිකම් කියන ඉඩම හා මාර්ගය ; |
| *දකුණට* | : | ඉඳිගහදෙනිය ඉඩම ; |
| *බටහිරට* | : | බොල්ගොඩ වැව සහ දාලේ රොබට් හිමිකම් කියන ඉඩම. |

08-597


1A - G 18048 — 150 (2013/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*